ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2015 ජූලි මස 22 වැනි දින |

## 2015 මැයි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

### සමස්ත නිරීක්ෂණ

2015 මැයි මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය ස්ථාවරව පැවතුණි. පසුගිය මාසයට සාපේක්ෂව අපනයනයන්හි සිදු වූ ඉහළ යෑම හේතුවෙන් 2015 මැයි මාසයේ දී වෙළඳ ගිණුමේ හිඟය අඩු විය. කෙසේ නමුත්, පසුගිය වසරේ මැයි මාසයට සාපේක්ෂව ආනයන වියදම් ඉහළ යෑම සහ අපනයන ආදායම් සුළු වශයෙන් පහළ යෑම හේතුවෙන් මාසය තුළ දී වෙළඳ ගිණුමේ හිඟය පුළුල් විය. මේ අතර, සංචාරක ඉපැයීම්, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ හා මූල්‍ය ගිණුම වෙත වූ අඛණ්ඩ විදේශ විනිමය ලැබීම් වසරේ පළමු මාස පහ තුළ දී විදේශීය අංශය කෙරෙහි හිතකර ලෙස දායක විය. 2015 මැයි මස අග වන විට දළ නිල සංචිත එ.ජ.ඩොලර් බිලියන 6.8 ක් විය. නවතම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතුව මෙන්ම අනෙකුත් විදේශ විනිමය ලැබීම් ද සමඟින් දළ නිල සංචිත 2015 ජූනි මාසය තුළ දී තවදුරටත් ශක්තිමත් විය.

### අපනයන ක්‍රියාකාරිත්වය

අපනයන ආදායම 2015 මැයි මාසයේ දී තවදුරටත් මන්දගාමී වූ අතර, එය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 883 ක් දක්වා සියයට 0.1 කින් සුළු වශයෙන් අඩු විය. රෙදිපිළි හා ඇඟලුම් අපනයනවල කැපී පෙනෙන වර්ධනයක් වාර්තා වුව ද, තේ, මුහුදු ආහාර සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ යන අපනයනයන්හි ක්‍රියාකාරිත්වය දුර්වලවීම මෙම අඩු වීම සඳහා දායක විය. රුසියාව සහ මැදපෙරදිග රටවල් වෙතින් වූ ඉල්ලුමෙහි අඩු වීමත් සමඟ විශාල ලෙස බලපෑමට ලක් වූ

තේ අපනයන, 2015 මැයි මාසයේ දී අඛණ්ඩව අට වන මාසයටත් අඩු වූ අතර, 2014 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 12.1 ක පහළ යෑමක් වාර්තා කළේය. 2014 වසරේ අනුරූප මාසය සමඟ සැසඳීමේ දී 2015 මැයි මාසයේ දී රුසියාව සහ මැදපෙරදිග රටවල් වෙත කළ තේ අපනයන පිළිවෙළින් සියයට 19.2 කින් සහ සියයට 9.7 කින් අඩු විය. 2014 ඔක්තෝබර් මාසයේ සිට අඛණ්ඩව පහත වැටුණු මුහුදු ආහාර අපනයන 2014 වසරේ අනුරූප මාසය සමඟ සැසඳීමේ දී 2015 මැයි මාසයේ දී තවදුරටත් සියයට 39.3 කින් පහත වැටුණි. 2015 ජනවාරි 13 වන දින සිට බලපැවැත්වෙන පරිදි යුරෝපා වෙළඳපොළ විසින් ශ්‍රී ලංකාවෙන් මුහුදු ආහාර ආනයනය කිරීම තහනමකට ලක් කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන මුහුදු ආහාර වෙළඳපොළ වන යුරෝපා සංගමය වෙත කරන ලද මුහුදු ආහාර අපනයන සියයට 74.8 කින් කැපී පෙනෙන ලෙස පහත වැටීම මෙම අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මැණික්, දියමන්ති සහ ස්වරණාභරණ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 25 ක් දක්වා සියයට 29.8 කින් අඩු විය. ඛනිජ නිෂ්පාදිත සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ ද මැයි මාසය තුළ දී අපනයන පහත වැටීම සඳහා දායක විය. 2015 මාර්තු සහ අප්‍රේල් මාස තුළ දී පහත වැටුණු, මුළු අපනයනයෙන් සියයට 45 ක් පමණ වන රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම, ඇමෙරිකා එක්සත් ජනපදය මෙන්ම කැනඩාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඕස්ට්‍රේලියාව වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළවල් වෙත කළ අපනයනයන්හි වර්ධනයන් පිළිබිඹු කරමින් 2015 මැයි මාසයේ දී සියයට 7.6 කින් වර්ධනය විය. කෙසේ වුවද, 2015 මාර්තු මාසයේ සිට පැවති අඩු වීමේ ප්‍රවණතාවය තවදුරටත් පෙන්නුම් කරමින් යුරෝපා වෙළඳපොළ වෙත කළ රෙදිපිළි හා ඇඟලුම් අපනයන 2015 මැයි මාසයේ දී සියයට 11.8 කින් අඩු විය. සමුච්චිත වශයෙන් සැලකූ විට, 2015 වසරේ පළමු මාස පහ තුළ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 4,471 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.2 කින් සුළු වශයෙන් වර්ධනය විය. ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ චීනය 2015 වසරේ පළමු මාස පහ තුළ දී ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ සඳහා ප්‍රධාන වෙළඳපොළවල් ලෙස පැවති අතර, මෙම රටවල් වෙත කරන ලද අපනයන මුළු අපනයනයෙන් සියයට 51 ක් පමණ විය.

**සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම**

| කාණ්ඩය | 2014 මැයි (එ.ජ.ඩො. මිලියන) | 2015 මැයි (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) | 2014 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | 2015 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **640.0** | **661.3** | **3.3** | **3,315.7** | **3,431.6** | **3.5** |
| රෙදිපිළි හා ඇඟලුම් | 365.1 | 392.9 | 7.6 | 1,966.7 | 1,981.0 | 0.7 |
| රබර් නිෂ්පාදිත | 78.0 | 76.2 | (2.3) | 360.3 | 332.5 | (7.7) |
| මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ | 35.0 | 24.6 | (29.8) | 163.6 | 147.5 | (9.8) |
| ප්‍රවාහන උපකරණ | 6.8 | 6.4 | (5.8) | 56.2 | 178.0 | 216.9 |
| යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ | 29.7 | 26.5 | (10.7) | 129.3 | 127.5 | (1.4) |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 29.5 | 25.2 | (14.6) | 157.8 | 175.8 | 11.4 |
| ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 22.6 | 26.5 | 17.0 | 121.4 | 110.5 | (9.0) |
| වෙනත් | 73.2 | 83.0 | 13.3 | 360.3 | 378.9 | 5.2 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **239.9** | **217.0** | **(9.5)** | **1,100.6** | **1,018.0** | **(7.5)** |
| තේ | 140.6 | 123.6 | (12.1) | 644.4 | 561.0 | (13.0) |
| පොල් | 30.1 | 32.9 | 9.0 | 132.0 | 142.3 | 7.8 |
| මුහුදු ආහාර | 24.5 | 14.9 | (39.3) | 115.8 | 72.3 | (37.5) |
| කුළුබඩු | 19.0 | 21.4 | 12.7 | 82.1 | 130.8 | 59.3 |
| වෙනත් | 25.6 | 24.3 | (5.4) | 126.2 | 111.6 | (11.6) |
| **3. ඛනිජ වර්ග සහ වෙනත්** | **3.7** | **4.3** | **17.6** | **47.9** | **21.8** | **(54.5)** |
| **මුළු අපනයන** | **883.5** | **882.5** | **(0.1)** | **4,464.2** | **4,471.4** | **0.2** |

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## ආනයන ක්‍රියාකාරිත්වය

2015 මැයි මාසයේ දී මුළු ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,585 ක් දක්වා සියයට 17.2 ක වර්ධනයක් වාර්තා කරමින් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඛණ්ඩව දෙවන මාසයටත් ඉහළ ගිය අතර, මේ සඳහා පාරිභෝගික භාණ්ඩ කාණ්ඩය යටතේ වර්ග කර ඇති පෞද්ගලික රථ වාහන සහ ආයෝජන භාණ්ඩ කාණ්ඩය යටතේ වර්ග කර ඇති වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා රථ වාහන ආනයනය මූලික විය. පෞද්ගලික භාවිතය සඳහා වන රථ වාහන ආනයනය පසුගිය වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 93 ක් දක්වා සියයට 87.1 කින් වර්ධනය වූ අතර, ප්‍රධාන වශයෙන් ත්‍රීරෝද රථ ආනයනය ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන

වියදම එ.ජ.ඩොලර් මිලියන 72 ක් දක්වා සියයට 117.2 කින් වර්ධනය විය. මෙයට අමතරව, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයනය ද, මුළු ආනයන වර්ධනය සඳහා සැලකිය යුතු ලෙස දායක විය. මෙම මාසය තුළ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම සියයට 21.8 කින් වර්ධනය වූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොටස්, මුද්‍රණ කටයුතු සඳහා යොදා ගන්නා යන්ත්‍රසූත්‍ර හා වෛද්‍ය සහ රසායනාගාර උපකරණ විශාල ලෙස ආනයනය කිරීමයි. රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම පසුගිය වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 16.3 කින් වර්ධනය වූ අතර, මේ සඳහා ගෙතූ රෙදි වර්ග, වියන ලද කපු රෙදි සහ ටයර් යොත් කැරලි රෙදි වර්ග වැනි රෙදිපිළි ආනයනය වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අතර 2015 මැයි මාසයේ දී පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන මිල සියයට 30.1 කින් අඩු වීම හේතුවෙන් පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන වියදම සියයට 14.1 කින් අඩු වීම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 264 ක් දක්වා සියයට 7.8 කින් අඩු විය. එසේ වුවද, බොර තෙල් ආනයන මිල අඩු වුවද ආනයන පරිමාව සැලකිය යුතු ලෙස වැඩි වීම හේතුවෙන් බොර තෙල් ආනයන වියදම සියයට 11 කින් වර්ධනය විය. මේ අතර, පොහොර සහ කිරි නිෂ්පාදිත ආනයන වියදම පිළිවෙළින් සියයට 20.9 කින් සහ සියයට 40.7 කින් අඩු වූ අතර, සහල් සඳහා පනවා තිබූ කිලෝ ග්‍රෑමයට රු.20 ක් වන විශේෂ වෙළඳ බද්ද 2015.03.26 වන දින සිට බලපැවැත්වෙන පරිදි කිලෝ ග්‍රෑමයට රු.40 ක් දක්වා වැඩි කිරීම හේතුවෙන් 2014 අප්‍රේල් මාසයේ සිට සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ සහල් ආනයන වියදම මැයි මාසයේ දී සියයට 23.8 කින් අඩු විය. සමුච්චිත වශයෙන් සැලකූ විට, 2015 පළමු මාස පහ තුළ දී ආනයන වියදම පසුගිය වසරේ අනුරූප කාලයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 7,868 ක් දක්වා සියයට 4.3 කින් වර්ධනය වූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන ද, දෙවනුව ආයෝජන භාණ්ඩ ආනයන ද හේතු විය. 2015 වසරේ ජනවාරි සිට මැයි දක්වා කාලය තුළ ඉන්දියාව, චීනය, ජපානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ සිංගප්පූරුව ප්‍රධාන ආනයන ප්‍රභවයන් වූ අතර මෙම රටවල් වෙතින් කළ ආනයන මුළු ආනයනයන්ගෙන් සියයට 60 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 2: ආනයන වියදම

| කාණ්ඩය | 2014 මැයි (එ.ජ.ඩො. මිලියන) | 2015 මැයි (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) | 2014 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | 2015 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **277.8** | **348.8** | **25.6** | **1,322.1** | **1,916.1** | **44.9** |
| ආහාර හා පාන වර්ග | 137.6 | 131.9 | (4.1) | 584.3 | 743.8 | 27.3 |
| කිරි නිෂ්පාදිත | 27.0 | 16.0 | (40.7) | 153.2 | 96.6 | (36.9) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 110.6 | 115.9 | 4.8 | 431.1 | 647.1 | 50.1 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 140.2 | 216.8 | 54.7 | 737.8 | 1,172.3 | 58.9 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 27.8 | 39.7 | 43.0 | 151.6 | 188.1 | 24.1 |
| රථවාහන | 49.7 | 93.0 | 87.1 | 246.4 | 477.9 | 93.9 |
| අනෙකුත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 62.7 | 84.1 | 34.1 | 339.8 | 506.3 | 49.0 |
| **2. අන්තර් භාණ්ඩ** | **794.7** | **889.2** | **11.9** | **4,667.3** | **4,042.3** | **(13.4)** |
| ඉන්ධන | 286.6 | 264.3 | (7.8) | 2,048.3 | 1,186.0 | (42.1) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 176.4 | 205.2 | 16.3 | 884.4 | 974.1 | 10.1 |
| රසායනික නිෂ්පාදිත | 63.2 | 67.0 | 5.9 | 311.8 | 354.9 | 13.8 |
| ඛනිජ නිෂ්පාදිත | 12.5 | 33.8 | 170.7 | 103.0 | 93.4 | (9.3) |
| මූල ලෝහ | 30.2 | 49.3 | 63.2 | 174.0 | 210.2 | 20.8 |
| කඩදාසි සහ ඝන කඩදාසි | 39.7 | 42.8 | 7.9 | 176.5 | 187.0 | 5.9 |
| තිරිඟු හා ඉරිඟු | 27.7 | 34.6 | 25.1 | 181.8 | 121.4 | (33.2) |
| පොහොර | 31.7 | 25.1 | (20.9) | 127.2 | 111.5 | (12.3) |
| වෙනත් | 126.7 | 167.1 | 31.9 | 660.3 | 803.7 | 21.7 |
| **3. ආයෝජන භාණ්ඩ** | **279.7** | **345.8** | **23.6** | **1,550.8** | **1,900.7** | **22.6** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 142.9 | 174.1 | 21.8 | 843.8 | 950.1 | 12.6 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 103.6 | 100.0 | (3.5) | 509.3 | 509.0 | (0.1) |
| ප්‍රවාහන උපකරණ | 33.0 | 71.6 | 117.2 | 196.6 | 439.5 | 123.6 |
| වෙනත් | 0.2 | 0.1 | (19.2) | 1.2 | 2.1 | 77.3 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.0** | **1.6** | **57.8** | **5.4** | **9.0** | **66.3** |
| **මුළු ආනයන** | **1,353.2** | **1,585.5** | **17.2** | **7,545.6** | **7,868.0** | **4.3** |

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය**







**වෙළඳ ශේෂය**

2014 වසරේ දී වාර්තා වූ අඩුම වෙළඳ හිඟය වන 2014 මැයි මාසයේ පැවති එ.ජ.ඩොලර් මිලියන 470 ට සාපේක්ෂව 2015 මැයි මාසයේ දී වෙළඳ ගිණුමේ හිඟය එ.ජ.ඩොලර් මිලියන 703 ක් දක්වා සියයට 49.7 කින් සැලකිය යුතු ලෙස පුළුල් විය. සමුච්චිත වශයෙන් සැලකූ විට, 2015 වසරේ පළමු මාස පහ තුළ දී වෙළඳ හිඟය එ.ජ.ඩොලර් මිලිය 3,397 ක් දක්වා සියයට 10.2 කින් වර්ධනය විය.

**සංචාරක ඉපැයීම්**

2015 මැයි මාසයේ දී සංචාරක පැමිණීම්, 2014 මැයි මාසයේ දී වාර්තා කළ 90,046 සිට 113,529 දක්වා සියයට 26.1 කින් වර්ධනය විය. 2015 මැයි මාසයේ දී සංචාරක ඉපැයීම්[1], 2014 මැයි මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 143.3 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 180.7 දක්වා සියයට 26.1 කින් වර්ධනය වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය 2015 මැයි මාසයේ දී සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන මූලාශ්‍ර පහ වූ අතර මාසය තුළ දී වූ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 49.8 කට පමණ දායක විය.

2015 ජූනි මාසයේ දී සංචාරක පැමිණීම්, 115,467 ක් ලෙස වාර්තා වූ අතර එය පසුගිය වසරේ අදාළ මාසයට සාපේක්ෂව සියයට 11.9 ක වර්ධනයක් විය. ඒ අනුව, 2015 වසරේ

[1] සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2015 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

පළමු මාස හය තුළ දී සමුච්චිත සංචාරක පැමිණීම්, 2014 වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව 830,051 දක්වා සියයට 14.1 කින් ඉහළ ගියේය. 2015 වසරේ පළමු මාස හය තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම්, 2014 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,157.9 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,321.4 දක්වා වර්ධනය විය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2015 මැයි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2014 මැයි මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 557.5 සිට එ.ජ.ඩොලර් මිලියන 537.7 දක්වා සියයට 3.5 කින් ආන්තික ලෙස අඩු විය. මේ අතර, 2015 වසරේ පළමු මාස පහ තුළ දී සමුච්චිත විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් 2014 වසරේ අනුරූප කාල පරිච්ඡේදය සමඟ සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 2,803.1 දක්වා සියයට 1.0 කින් සුළු වශයෙන් වර්ධනය විය. කෙසේ නමුත්, වසරේ දෙවන භාගය තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මූල්‍ය ලැබීම්**

රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන 2014 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 196.5 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව 2015 වසරේ පළමු මාස හය තුළ දී එ.ජ.ඩොලර් මිලියන 237.3 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. වසරේ පළමු මාස පහ තුළ දී ද්විතීයික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 33.5 ක ශුද්ධ ලැබීම් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 24.7 ක ලැබීම් ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ විදේශීය ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 58.2 ක් විය. මේ අතර, 2015 ජූලි මස 21 දින වන විට කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ සමුච්චිත ශුද්ධ ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 33.1 ක් විය. 2015 වසරේ පළමු මාස පහ තුළ දී රජය විසින් ලබාගත් දිගුකාලීන ණය, 2014 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේ දී ලබාගත් එ.ජ.ඩොලර් මිලියන 848.1 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 372.0 ක් විය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2015 වසරේ පළමු මාස පහ තුළ දී සමස්ත ගෙවුම් තුලනය 2014 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 1,665.1 ක අතිරික්තයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,307.8 ක හිඟයක් වාර්තා කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත**

2015 මැයි මස අග වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ආනයනික මාස 4.2 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 6.8 ක් වූ අතර මුළු විදේශීය සංචිත ආනයනික මාස 5.3 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 8.7 ක් විය. කෙසේ නමුත්, නවතම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතුව තුළින් ලද ලැබීම් සහ අනෙකුත් විනිමය ලැබීම් සමඟින් 2015 ජුනි මස අග වන විට දළ නිල සංචිත එ.ජ.ඩොලර් බිලියන 7.5 දක්වා ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**විනිමය අනුපාතිකයේ හැසිරීම**

2014 වසරේ අග සිට 2015 ජූලි මස 21 දින දක්වා වූ කාලය තුළ දී රුපියල එ.ජ.ඩොලරයට සාපේක්ෂව සියයට 2.1 කින් අවප්‍රමාණය විය. කෙසේ නමුත්, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම මත පදනම්ව, මෙම කාල පරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යුරෝවලට එරෙහිව සියයට 10.0 කින් ද, ඔස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 9.2 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 2.0 කින් ද අධිප්‍රමාණය වූ අතර ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 2.0 කින් හා ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 1.6 කින් අවප්‍රමාණය විය.

## සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2014 මැයි (එ.ජ.ඩො. මිලියන) | 2015 මැයි (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) | 2014 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | 2015 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 883.5 | 882.5 | -0.1 | 4,464.2 | 4,471.4 | 0.2 |
| ආනයන | 1,353.2 | 1,585.5 | 17.2 | 7,545.6 | 7,868.0 | 4.3 |
| වෙළඳ ශේෂය (අතිරික්තය (+)/හිඟය (-)) | -469.7 | -702.9 | 49.7 | -3,081.5 | -3,396.6 | 10.2 |
| සංචාරක ඉපැයීම් | 143.3(ආ) | 180.7 | 26.1 | 993.6(ආ) | 1,137.6 | 14.5 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 557.5 | 537.7 | -3.5 | 2,774.8 | 2,803.1 | 1.0 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | 69.9 | 13.3 | -81.0 | 19.2 | 58.2 | 203.1 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 186.5 | 88.8 | -52.4 | 3,239.2 | 918.3 | -71.7 |
| එයින්, | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 92.8 | 10.1 | -89.1 | 874.9 | 526.1 | -39.9 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 1,500.0 | - | |
| දිගුකාලීන ණය | 85.0 | 77.2 | -9.2 | 848.1 | 372.0 | -56.1 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.
(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විදේශ ආයෝජකයන් වෙත ආයෝජනය කිරීමෙන් ලද ලැබීම්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.